IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2018/2019
## (දෙවන සෙමෙස්තරය)

## (පවත්වන ලද්දේ 2021 අගෝස්තු, සැප්තැම්බර්)

# BLE 205 - කම්කරු නීතිය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

1) මුළු ලකුණු 100 යි.

2) මෙම ප්‍රශ්න පත්‍රය **ප්‍රශ්න අට (08) කින්** සහ **පිටු** දෙකකින් **(02) කින්** සමන්විත වේ.

3) **ඕනෑම ප්‍රශ්න පහ (05) කට පමණක්** පිළිතුරු සැපයිය යුතු වේ.

4) කාලය **පැය තුන (03) යි.**

5) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාග ශාලාධිපතිට දැනුම් දෙන්න.

1. ජාත්‍යන්තර ප්‍රමිතීන්ගේ රැකවරණය ද සහිතව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කම්කරු නීති ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප ආශ්‍රිතව ශ්‍රමය සපයන ශ්‍රමික ජනතාවගේ සුරක්ෂිතභාවය උදෙසා ප්‍රමාණවත් ද? ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රමිකයන්ගේ නෛතික තත්වය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් උක්ත ප්‍රකාශය පිළිබඳව විමර්ශනාත්මකව අදහස් දක්වන්න.

**(ලකුණු 20)**

2. (අ) ශ්‍රී ලංකාවේ රැකියා පරිසරය තුළ ආධුනිකයා (පුහුණුවන්නා) ගේ නෛතික තත්වය කෙසේද? (ලකුණු 10)

(ආ) පරිවාසිකයකුගේ සේවය අවසන් කිරීමකදී සේවා යෝජක ඒ පිළිබඳව හේතු දැක්වීමට බැඳී සිටීද? (ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

3. අධිකරණ ක්‍රියාදාමය තුළ කලින් කලට විනිශ්චය වූ නඩු තීන්දු මඟින් නිර්මාණය වූ පරීක්ෂණ, රැකියා ගිවිසුමක "සේවකයා" හඳුනා ගැනීම විෂයෙහි කෙසේ ක්‍රියාත්මක වී තිබේද? විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

4. "විෂමාචාර ක්‍රියාවක් මත සේවකයකුගේ සේවය අවසන් කළ හැකි ද යන්න පිළිබඳව අධිකරණය විසින් විනිශ්චිත නඩු තීන්දු මඟින් කලින් කලට මාර්ගෝපදේශ සපයා ඇත." විනිශ්චිත නඩු තීරණ ඇසුරෙන් මෙම ප්‍රකාශය තහවුරු කරන්න.

**(ලකුණු 20)**

5. "ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ජාත්‍යන්තර නීති ප්‍රතිපාදන වල දායකත්වය ද සහිතව ශ්‍රී ලංකාවේ දේශීය නීති පද්ධතිය තුළ ද විශාල නීති ප්‍රමාණයක් ක්‍රියාත්මක වේ. එහෙත් සෑම අවදානම් සහගත තත්ත්වයකින්ම ළමයා සුරක්ෂිත ද යන්න විවෘත සංවාදයකට තුඩු දුන් කරුණකි." ජාත්‍යන්තර නීති සහ ශ්‍රී ලංකාවේ දේශීය නීති ප්‍රතිපාදන කෙරෙහි ද අවදානය යොමු කරමින් උක්ත ප්‍රකාශය පිළිබඳව විවේචනාත්මකව විමර්ශනය කරන්න.

**(ලකුණු 20)**

6. “ශිෂ්ට සම්පන්න රැකියා පරිසරයක් බිහි කිරීම, කම්කරු අයිතිවාසිකම් නගා සිටුවීම යන අරමුණු පෙරදැරි කරගෙන වර්ෂ 1919 වෙසයිල්ස් සම්මුතිය (සාම සම්මුතිය) හරහා ස්ථාපිත වූ අන්තර්ජාතික කම්කරු සංවිධානය පුරා අවුරුදු සියයකට වඩා වැඩි කාලයක් තිස්සේ මේ වන විටත් සක්‍රියව ක්‍රියාත්මක වෙමින් පවතී.” අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සාමාජික රටක් ලෙසට ශ්‍රී ලංකාව සහ අන්තර් ජාතික කම්කරු සංවිධානය අතර පවතින සම්බන්ධතාවය කෙරෙහි ද අවධානය යොමු කරමින් උක්ත ප්‍රකාශය පිළිබඳව සාකච්ජා කරන්න.

**(ලකුණු 20)**

7. “ශ්‍රී ලංකාවේ රැකියා පරිසරය තුළ ශ්‍රමය සපයන කම්කරු ජනතාවගේ රැකියාව අසාධාරණ සහ අයුක්ති සහගත ලෙස අවසන් කිරීම වැළැක්වීම උදෙසා 1971 අංක 45 දරණ සේවකයින්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධි විධාන) පනත අද දවසේත් සංශෝධන සහිතව ක්‍රියාත්මක වේ.” 1971 අංක 45 දරණ සේවකයින්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධි විධාන) පනතේ ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීන්දු කෙරෙහි ද අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය පිළිබඳව කරුණු දක්වන්න.

**(ලකුණු 20)**

8. (අ) තාවකාලික සේවකයකු ලෙස හෝ අනියම් සේවකයකු ලෙස සේවයට පැමිණෙන ශ්‍රමිකයකුට ස්ථිර සේවකයකුගේ සේවා තත්ත්වය ඉල්ලා සිටිය හැකිද ?

(ලකුණු 10)

(ආ) නිශ්චිත කාලින සේවා ගිවිසුමක් අවසන් වීම මත කම්කරු විනිශ්චය සභාවකින් සහන ඉල්ලා සිටිය හැකිද ? (ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

******